පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

# මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## "දිට්වා" ආපදා තත්ත්වය මත මධ්‍යම පළාත් සභාවේ ආයතන සඳහා සිදු වූ හානිය යථාවත් කිරීමට අතිරේක කාර්ය මණ්ඩලය ලබාගැනීම

**"දිට්වා" ආපදා තත්ත්වය මත හානියට පත්වූ මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග නැවත යථාවත් කිරීම පිණිස පහත දැක්වෙන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ**

### ඉංජිනේරු (සිවිල්) - තනතුරු 03

- **මාසික දීමනාව :**

  MM 1-1 වැටුප් කේතයේ 11 ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 81,710/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 99,510/- ක දීනාවක් හිමි වේ.

- **සුදුසුකම් (පහත සුදුසුකම් 1 හෝ 2)**

  1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

     **සහ**

     උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබීම.

  2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

  (අයදුම්කරුවන් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ආශ්‍රිත සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම අනිවාර්ය වේ.)

- **වයස -**

  අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

### ප්‍රමාණ සමීක්ෂක - තනතුරු 03

- **මාසික දීමනාව :**

  MM 1-1 වැටුප් කේතයේ 11 ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 81,710/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 99,510/- ක දීමනාවක් හිමි වේ.

- **සුදුසුකම් (පහත සුදුසුකම් 1 හෝ 2)**

  1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

     **සහ**

     උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබීම.

  2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස :**

  අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

### මිනින්දෝරු - තනතුරු 01

- **මාසික දීමනාව :**

  MM 1-1 වැටුප් කේතයේ 11 ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි. උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 81,710/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 99,510/- ක දිනාවක් හිමි වේ.

- **සුදුසුකම් (පහත සුදුසුකම් (හෝ 2)**

  1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක මැනුම් විද්‍යා උපාධියක් ලබා තිබීම.

     **සහ**

     උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබීම.

  2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය කශේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම්.

- **වයස :**

  අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

### තාක්ෂණ නිලධාරී (සිවිල්) - තනතුරු 12

- **මාසික දීමනාව :**

  JM 1-1 වැටුප් කේතයේ 11 ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 65,633/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 83,433/- ක දීමනාවක් හිමි වේ.

- **සුදුසුකම් (පහත සඳහන් 1 හෝ 2 හෝ 3 )**

  1. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි ((NVQ-7) හත්වැනි මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි ((NVQ-6) හය වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

     **සමග**

     සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (5) ක පළපුරුද්දක් ලබා තිබීම.

  3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි ((NVQ-5) පස්වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

     **සමග**

     සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස :**

  අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

### කාර්මික සහකාර - තනතුරු 20

- **මාසික දීමනාව :**

  MA 2-1 වැටුප් කේතයේ 111 ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 46,960/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 64,760/-ක දීමනාවක් හිමි වේ.

- **සුදුසුකම්**

  එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක NCT (සිවිල්) හෝ NCIT (සිවිල්) ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- **වයස :** අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

### සැළසුම් ශිල්පී - තනතුරු 02

- **මාසික දීමනාව :**

  MA 2-1 වැටුප් කේතයේ 111 ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 46,960/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 64,760/- ක දීමනාවක් හිමි වේ.

- **සුදුසුකම් :**

  එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක NCED (ජාතික සහතික ඉංජිනේරු සැලසුම් ශිල්පී) ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

### වැඩ පාලක - තනතුරු 30

- **මාසික දීමනාව :**

  MA1-1 වැටුප් කේතයේ 111 ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 43,312/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 61,112/- ක දීමනාවක් හිමි වේ.

- **සුදුසුකම්**

  (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

  i. සිංහල/දෙමළ

  ii. ගණිතය

  යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04)ක් සඳහා සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම

  **සහ**

  (ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුන (03) ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

  (ඇ) ඉදිකිරීම් සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- **වයස**

  අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

**පොදු කොන්දේසි**

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවනු අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.
5. රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරනු ලබන්නේ නම් ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.
6. අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස්කර එවිය යුතු අතර, තමා පිළිබඳ තොරතුරු ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.
7. ඔබ විසින් යොමු කරනු ලබන අයදුම්පත්‍රයේ සඳහන්ව ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුව හොත් නුසුදුස්සෙකු සේ සලකා ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.
8. අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය**

- සියලුම් තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

  මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම. අයදුම්කරු මෙම තනතුර සඳහා පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

  සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් ජීව දත්ත විස්තර ඇතුළත් කර සකස් කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත්ද (සහතික කරන ලද) සමග බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කර 2026.05.27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.**
**මධ්‍යම පළාත.**

**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**අංක 09. ඇහැලේපොළ කුමාරිහාමි මාවත,**
**බෝගම්බර, මහනුවර.**

**දුරකථන අංකය 081-2204378**